# නුවරකලාවියේ උලගල්ල කෝරළයට අයත් කට්ටමුරිච්චාන ග්‍රාමය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

*එස්.එස්.අයි.එම්. සෙනෙවිරත්න [1], බී.ආර්.විමලසේන [2], පී.ටී.සී. මධුවන්ති [3]*

කට්ටමුරිච්චාන ග්‍රාමය උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වියළි කලාපීය දේශගුණයක් සහිත කුඩා ලඳු කැලෑවලින් වට වී තිබෙන අතීතයේ උලගල්ල කෝරළයට අයත් වූ ත්, වර්තමානයේ මරදන්කඩවලට ආසන්නව පිහිටා තිබෙන ඓතිහාසික වැදගත්කමකින් යුක්ත ග්‍රාමයකි. වත්මන් සමාජය තුළින් වියැකී යන ලාංකිකයන්ට ආවේණික වූ ගැමි සංස්කෘතිය නැවත ඉස්මතු කර ගනිමින් එම ග්‍රාමීය පරිසරය පිළිබඳ ඓතිහාසික තතු හඳුනාගැනීම, ග්‍රාමීය භූගෝලීය පිහිටීම හඳුනාගැනීම, ග්‍රාමය ආරම්භ වූ ආකාරය සහ විකාසනය හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණු වේ. නුවරකලාවියේ උලගල්ල කෝරළයට අයත් ග්‍රාමීය පරිසරයකට උරුමකම් කියන කට්ටමුරිච්චාන ග්‍රාමයේ ඓතිහාසිකත්වය කෙබඳුද යන්න විමර්ශනය කිරීම පර්යේෂණයේ ගැටලුව වේ. කට්ටමුරිච්චාන ග්‍රාමය මූලික කරගෙන පර්යේෂණ සිදු කර නොමැති අතර නුවරකලාවියේ උලගල්ල කෝරළයට නොහොත් උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට කට්ටමුරිච්චාන ග්‍රාමය අයිති වන නිසා ඒ ආශ්‍රිතව සිදු කර ඇති පර්යේෂණ සාහිත්‍ය විමර්ශන යටතේ අධ්‍යයනය කරනු ලැබේ. තව ද ක්ෂේත්‍ර අධ්‍යයනය ඔස්සේ ග්‍රාමය පිළිබඳ තොරතුරු එක් රැස් කරනු ලැබේ. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පොත්පත්, සිතියම් සහ ඡායාරූප පිළිබඳව අධ්‍යයනයක නිරත වෙමින් දත්ත එක් රැස් කිරීම ද කට්ටමුරිච්චාන ග්‍රාමයේ වැඩිහිටි පිරිසක් අහඹු ලෙස තෝරා ගනිමින් සම්මුඛ සාකච්ඡාවලට බඳුන් කරමින් ද ලබාගන්නා තොරතුරු හා දත්ත විශ්ලේෂණ විධික්‍රමවේද යොදා ගනිමින් විමර්ශනය කෙරේ. කට්ටමුරිච්චාන ග්‍රාමයේ භෞතික පරිසරය, වර්තමානයේ පවතින ගොඩනැගිලි, විවිධ ස්ථාන, නටඹුන් සහිත ස්ථාන සහ පාරිසරික සාධක පිළිබඳ සොයා බලා දත්ත විවරණය කිරීමට යොමු විය. මානව ක්‍රියාකාරකම් සහ සමාජ බලපෑම් නිසා කට්ටමුරිච්චාන ග්‍රාමයට සිදු වී තිබෙන බලපෑම්, අහිමි වූ දේවල්, වියැකී යන ඉතිහාසය, මිනිසුන්ගේ සාමූහිකත්වය පදනම් කරගෙන ගොඩ නැගුණු සමාජ ක්‍රමය සහ සංස්කෘතිය පිළිබඳ ව මෙම පර්යේෂණය තුළින් හඳුනා ගැනීමට හැකි විය. ගොවිගම කුලය මූලික වූ සමාජ ක්‍රමය නිසා අසල්වැසි ග්‍රාමයන් සම්බන්ධතා පවත්වා ගැනීම විවිධ සීමාවලට ලක් වී තිබීම මුල්කාලීන ලක්ෂණයක් වුව ත්, වර්තමානය වන විට එම කාරණාව යටපත් වී ආවාහ විවාහ කටයුතුවල දී පමණක් සීමා වී ඇත. පූජනීය වශයෙන් මහ දේව වන්දනය වැනි අභිචාර විධි පාරම්පරිකව පවත්වාගෙන ගිය ද වර්තමානය වන විට එම පරම්පරාව වියැකී යාම ගමේ සාමූහිකත්වයට බලපෑම් කර තිබේ. එමෙන් ම කට්ටමුරිච්චාන මහ විදුහලේ පරිහානීය තත්ත්වය ග්‍රාමයේ පැවැත්මට පවා බලපෑම් කර තිබේ. මෙම භූමිය තුළ ඓතිහාසික සිද්ධීන් පිළිබඳ තොරතුරු හඳුනාගැනීමට හැකි වූ අතර මෙතෙක් කාලයක් ඒ පිළිබඳ කිසිවෙකුගේ අවධානයක් යොමු නොවී තිබෙන බවත් ඓතිහාසික නුවරකලාවිය සම්බන්ධ ඉතිහාසයේ මිනිසුන් තුළ ඇති සාමූහිකත්වය, අභියෝග සඳහා මුහුණ දුන් ආකාරය, ඔවුන්ගේ සමාජ සම්බන්ධතා සහ පරිසරය සමග මුසු වූ ජීවනාවලිය ආදී ලක්ෂණ මෙම ග්‍රාමීය පරිසරය තුළ දැක ගත හැකි බවත්, පැවතුණු අතර වර්තමානය වන විට ඒවා වියැකී යන තත්ත්වයට පත් වී තිබෙන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** අනුරාධපුර දිස්ත්‍රික්කය, කට්ටමුරිච්චාන ග්‍රාමය, නුවරකලාවිය, සමාජ ක්‍රමය, සංස්කෘතිය

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. isharamad56@gmail.com
[2] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
[3] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.